# සිංහල භාෂාවේ සම්භවය හා වර්ණ මාලාවේ පරිණාමය.

කථිකාචාර්ය දුනුකේවත්තේ ගුණරතන හිමි.

යම්කිසි භාෂාවක් ජීවමාන නම් භාවිතයේ පවතීනම් එහි ස්වභාවය කලින් කලට, යුගයෙන් යුගයට සම්මතාශ්‍රිත රීතින් ඔස්සේ වෙනස් වීමය. ඒය භාෂා සම්බන්ධයේ මතු නොව ඕනෑම භෞතික වස්තුවක් සම්බන්ධයෙන් පවත්නා සනාථන ධර්මතාවකි. ජීවමාන භාෂාව අනවරත ප්‍රවාහයක් වැනි ය. විවිධ භාෂාවන්ගෙන් අක්ෂර, පද, වචන, වාක්‍ය හා යෙදුම් සමකාලීන වෙනත් භාෂාවන්ගෙන් එම භාෂාවට එක්වීමත්, එම භාෂාවෙන් වෙනත් භාෂාවල ගලායෑමත්, ජීවමාන භාෂා සම්බන්ධයෙන් සිදුවන අනිවාර්ය ක්‍රියාදාමයකි. මෙය වෙනස් වන්නේ නම් ඒ ඉතාමත් ම කලාතුරකිනි. එබැවින් යම් භාෂා ප්‍රේමියකු මෙම ධර්මතාව නොසළකා, සිය බස පාරිශුද්ධ වස්තුවක් සේ සළකා, වෙනත් භාෂාවලින් පැමිණෙන යට කී අංගෝපාංග බැහැර කිරීමට යත්න දරතොත් ඔහුගේ වෑයමේ ප්‍රතිඵලය එක්කෝ භාෂාව හුදකලාවීම ය. නැතහොත් භාෂාව මිය යෑම ය. සිය බස පෝෂණය සඳහාය කියා වෙනත් භාෂාවකින් ලැබෙන ඕනෑම නොසරුප් වචනයක්, වාක්‍යක් හෝ යෙදුමක් තමන්ගේ භාෂාවට වැද්දගත යුතුය යන මුග්ධ මතය අනුමත කිරීමක් මෙයින් අදහස් නොකරන වග මෙහිදී මුලින් ම අවධාරණය කළ යුතු ය.

භාෂාවේ අධ්‍යතන ස්වරූපය වටහා ගැණීමට නම් එහි යටගියාව දැන සිටිය යුතු ය. එවිටය, භාෂාවේ පරිණාමය මනාව දැකගත හැකිවනුයේ. එබැවින් සිංහල භාෂාවේ සහ වර්ණමාලාවේ ඉතිහාසයත් පරිණාමයත්, එහි වර්තමාන ස්වරූපයත් ඉතාමත් ම සැකෙවින් සමාලෝචනය කිරීමක් මෙම නිබන්ධයෙන් අභිප්‍රේත ය.



සිංහල භාෂාවේ ඓතිහාසික පදනම සාකච්ඡා කරන විට එම භාෂාවේ උරුමකරුවන් වූ සිංහල නම් වර්ගයා නොහොත් ජාතිය පිළිබඳවත්, ඔවුන්ගේ නිජබිම වූ කලක් **"සීහලද්වීප"** නමින් හඳුන්වා ඇති ශ්‍රී ලංකාව පිළිබඳවත්[1] සැකෙවින් වුව විමසා බැලිය යුතු ය. ජාතියේ ඉතිහාසය හෝ භාෂාවේ ඉතිහාසය හෝ ව්‍යාකරණාංගයක් නොවන බැවින් ව්‍යාකරණ නිබන්ධයක එබඳු විස්තර ඇතුලත් කිරීම අපරාධයකැයි කුමාරතුංග මුනිදාසයන් ප්‍රකාශ කොට තිබුණද,[2] භාෂාවක වර්තමාන ස්වරූපය පිළිබඳ පර්යේෂණ කරන්නෙකුට ව්‍යාකරණාංගයක් නොවුවත් ජාතියේත් භාෂාවේත් ඉතිහාසය එම පර්යේෂණයට ආලෝකයක් සපයන බැවින් යට කි අපරාධය යන්තමින් වුව මෙහිදී කිරීමට සිදු වේ.

ඉන්දු යුරෝපීය භාෂා පවුලට අයත් එය ඉන්දු ආර්ය භාෂාවකි, සිංහලය. එය හින්දි, ගුජරාටි, මරාටි, සින්දි සහ බෙන්ගාලි ආදී භාෂාවන්ට සමීප ඥාතිත්වයක් දක්වයි. ලෝකයේ පවත්නා ප්‍රධාන පෙළේ භාෂා ආර්ය, තුරාණ හා සිමිටික් යනුවෙන් ප්‍රධාන කොටස් තුනකට බෙදන බවත්[3] ඒවා අතුරින් සිංහල භාෂාව අයත් වන්නේ ද්‍රවිඩ ආදි භාෂා අයත් වන තුරාණ ගණයට නොව, සංස්කෘත ආදී භාෂා අයත් වන ආර්ය ගණයටය යන්න භාෂාශාස්ත්‍රඥයින්ගේ පොදු පිළිගැනීමක් බවට පත්ව ඇත.[4]

සිංහල භාෂාවේ උරුමකරුවෝ සිංහලයෝ ය. එබැවින් ඔවුන්ට ඓතිහාසිකත්වය සළකා බැලීම, සිංහල භාෂාවේ ඓතිහාසිකත්වය සෙවීමට උපකාරී වේ.

සිංහල ජාතියේ ඉතිහාසය සඳහන්ව ඇති ඉපැරණි ම ග්‍රන්ථවලට අනුව නම් සිංහල ජාතියේ සම්භවය සිදුවී ඇත්තේ විජයාවතරණයෙන් පසුව ය.[5] විජයගේ පැමිණීමෙන් පසුව, දඹදිවින් විවිධ පිරිස් මෙහි පැමිණෙන්නට ඇති බවත්, ඔවුන් සින්දු දේශීය ආර්ය භාෂා ගණයෙහි ඇතුළුවන එක්තරා ප්‍රාකෘත විශේෂයකින් කතාබහ කරන්නට ඇතැයි සර් ඩී.බී. ජයතිලකයින් ඉදිරිපත්කරන මතය ද මෙහිදී සළකා බලනු වටී.[6]

මෙම ප්‍රාකෘත විශේෂය ම සිංහල විණි ද? නැතහොත් භාරත දේශයේත් ලංකාවේත් මේ වනවිට එක සමාන භාෂාවක් පරිහරණය විණිද යන්න විමසා බැලිය යුතුව ඇත. අරහන්ත මහින්ද තෙරුන් වහන්සේ ලක්දිව වැඩම කළ මොහොතේ උන්වහන්සේ කළ ආමන්ත්‍රණය තිස්ස රජුට වැටහී ගියේ උන්වහන්සේ සිංහලෙන් ධර්ම දේශනා කළ නිසා ද? නැතහොත් භාරතීය භාෂාව ලාංකිකයින්ට වැටහෙන මට්ටමට මෙම භාෂා අතර සාම්‍යත්වයක් තිබුණේද? යන්න සොයා බැලිය යුතු ය. අරහන්ත මහින්ද හිමියෝ ස්ථාන දෙකකදී ම සිංහලෙන් ද ධර්ම දේශනා කර ඇත.[7] එහෙත් මෙම භාෂා සාම්‍යත්ත්වය ගැන මහාවංශයෙන් හා දීපවංශයෙන් ලැබෙන තොරතුරු ප්‍රමාණවත් නොවන්නේ එම පොත් දෙක ම විවිධ වර්ණනාවන් ද සහිතව ඇතැම්, කරුණු අතිශයෝක්තියෙන් දක්වා ඇති හෙයිනි.

ක්‍රි.පූ. 250 ට පෙර ඉතිහාසය ගැන මහාවංශයේ දැක්වෙන පුරාවෘත බොහෝමයක් මිත්‍යා කථාවන් ආශ්‍රයෙන් ගොඩනැගී ඇතැයි[8] ඇතැම් විචාරකයෙක් මහාවංශය දෝෂදර්ශනයට ලක්කරන්නේ ද මේ නිසා විය යුතු ය. මහාවංශය පමණක් නොව දීපවංශය ද ස්වතන්ත්‍ර ඒකීය ඓතිහාසික ලේඛනයකට වඩා විවිධ ප්‍රවාදයන්ගෙන් සමන්විත වූවක් බව එම විචාරකයා ම පවසා ඇත.[9] එහෙත් තවත් ඇතැම් පඬිවරයෙක් පවසන්නේ වංශකථාගත තොරතුරු කෙලින් ම ඉවත නො දමා සිංහල ජාතියේත්, සිංහල භාෂාවේත් සම්භවය විජය රජුගෙන් පසුව ඇතිවූ බව තීරණය කළයුතු බව ය.[10]

සිංහලයේ ඓතිහාසික පදනම සාකච්ඡා කිරීමේ දී යට කී හේතු නිසා වංශකථාගත තොරතුරු පමණක් ම ගැනීම එතරම් යෝග්‍ය නො වේ. එබැවින් මෙහිදී ඒ සඳහා ශිලා ලේඛන මෙන් ම ලක්දිව පුරා විසිරී පවතින ජනශ්‍රැති ද අවිධිමත් මූලාශ්‍රයන් ලෙස යොදා ගත හැකි ය.

වංශ කථාවලට අනුවත්, ජනශ්‍රැතිවලට අනුවත් ප්‍රාග් විජයීය සමයේ ලක්දිව වාසයකොට ඇත්තේ යක්ෂ, නාග, රාක්ෂසාදී අමනුෂ්‍ය කොට්ඨාසයන් ය. විජය ඔවුන් පරාජය



කිරීමෙන් පසුව විජයගේ සිට සිංහල ජාතිය ආරම්භ වී ඇත. මහාවංශයට අනුව සිය පියා වූ සිංහයා මරා දැමූ සිංහබාහුගේ පුත් විජය නිසා සිංහල ජාතිය ඇතිවිණි.[11]

මෙම විජයාවතරණය පිළිබඳ සිද්ධිය ඉතිහාසඥයින් අතර බෙහෙවින් ම විවාදයට තුඩු දී ඇත. එමෙන් ම සිංහයකු මැරීම නිසා සිංහල ජාතිය ඇති විණියි සඳහන් පුවත ද විමතිමතික අදහසක්ව පවතී. මෙම අදහස සිංහල ජාතියේ ප්‍රෞඪත්වය ශූරත්වය හා ධීර-වීර බව ප්‍රකට කරවීම සඳහා වංශකථාකරුවන් විසින් නිර්මානය කරන ලද්දක් ද යන්න ද සොයා බැලිය යුතුව ඇත. මෙබඳු නිර්මාණාත්මක ප්‍රබන්ධ නිසා මෙන් ම නිර්මාණාත්මක ජනශ්‍රැති නිසා සිංහලයාගේ සම්භවය මතු නොව සිංහල භාෂාවේ සම්භවය සෙවීම ද මහත් අපහසු කාර්යයක්. බවට පත්ව ඇත.

වංශකථාවලට පමණක් නොව පැරණි ග්‍රන්ථකාර බොහෝ කතුවරුන්ට ද සිංහල ජාතිය සිංහයෙකුට සම්බන්ධ කිරීමට දැඩි අවශ්‍යතාවක් තිබූ බව පැරණි ග්‍රන්ථ විමසීමෙන් පෙනී යයි. ක්‍රි.ව. 10 සියවසට අයත් ධම්පියා අටුවා ගැටපදය සිංහල යන පදය විග්‍රහකොට ඇත්තේ ද මෙම 'සිංහ කතාව' මුල්කරගෙන ම ය.'

'සිහබා රජු සීහකු මරා සීහල නම් වී 'සීහං ලුනවා ඉති සීහලො'[12]

රාජකුමාරිකාවක් සිංහයෙකු සමඟ සංවාසයේ යෙදීමත් සිංහයෙකු නිසා ඇයට මනුෂ්‍ය දරුවෙක් බිහිවීමත්, සිංහබාහු නම් වූ එම දරුවා සියපියා වූ සිංහයා මරා දමා සිය මව මනුෂ්‍ය වාසයට කැඳවාගෙන පැමිණීමත් "**සිංහබාහු**" වැනි නාට්‍යයකට මිස ජාතියක ඉතිහාසය පැහැදිලි කිරීමට තරම් ප්‍රමාණවත්වන විශ්වසනීයත්වයෙන් පරිපූර්ණ පුරාවෘතයක් නොවේය යන්න අද පොදු පිළිගැණීමක් බවට පත්ව ඇත. එබැවින් එම පුරාවෘත්තය සංශෝදනය විය යුතුව ඇතැයි සිතේ. එම කාර්යයෙහි ලා ආචාර්ය ඒ.ඒ. අබේසිංහයන් දක්වා ඇති මතය මෙහිලා අගය කළ යුතුව ඇත.[13] ඔහුගේ අදහසට අනුව සුප්පා දේවිය පැහැරගෙන

ගොස් ගල් ලෙනක සැඟවී සිටින්නට ඇත්තේ සිංහයෙකු නොව, ලංකාද්වීපයෙන් භාරතයට ගොස් සිටි මං පහරමින් ධනය රැස් කළ සොර දෙටුවෙක් විය හැකි ය. මේ බව රාවණ, තාරකාදී අතීත ලංකාවාසීන්ගේ ඇතැම් සැහැසි ක්‍රියා කලාපයන්ගෙන් ද පැහැදිලි වේ.

අනෙක් අතට ප්‍රාග් විජයීය යුගයේ ලක්දිව වැසි ජනතාව වංශකථාකරුවන් කියන තරමේ ම්ලේච්ඡයන්යැයි සිතීම ද අපහසු ය. මෙයට හොඳම නිදසුන රාවණා පුරාවෘතය යි. අවාසනාවට රාවණා යුගය පිළිබඳව හමුවී ඇති පුරාවිද්‍යාත්මක සාධක අල්ප ය. මේ පිළිබඳ තවත් කරුණු සාකච්ඡා කළ යුතුව ඇතත්, මේ නිබන්ධයේ අරමුණ විශේෂයෙන් සිංහල බස හා අක්ෂර පිළිබඳ සාකච්ඡා කිරීම වන බැවින් සිංහලයාගේ සම්භවය යනු වෙනම ම පර්යේෂණය කළයුතු පුළුල් තේමාවකි. කෙසේ වුවත් සිංහල ජාතියේ සම්භවය විජයාවතරණය ඉක්මවා යන බව පමණක් මෙහිදී සටහන්කොට තබමි.

**සිංහල භාෂාව.**

සිංහල නම් වූ ජනවර්ගයාගේ භාෂාව සිංහල භාෂාවයි. සිංහල දීපයේ භාවිත වූ හෙයින් මෙම භාෂාව සිංහල යනුවෙන් හැඳින්විණි ද යන්න ද සොයා බලනු වටී. යට දැක්වූ පරිදි සිංහල ජාතියේ සම්භවය පිළිබඳ ඇති අදහස් ද විමතිමතික ය. ඒ නිසා මෙම භාෂාව ජාතිය නිසා හෝ දේශය නිසා මේ නමින් හැඳින්වෙන්නට ඇත. එම මත දෙක මෙසේ පැහැදිලිව දැක්විය හැක.

> සිංහයෙකු මරාදැමීමෙන් හටගත් නිසා හෝ සිංහල ලේවලින් හටගත් නිසා 'සිංහල' නමින් ජාතියක් ඒ ජාතිය භාවිත කළ භාෂාව 'සිංහල' වන්නට ඇත.
>
> කුරුඳුවලට ද සිංහල යන නම භාවිත වන හෙයින් කුරුඳු වැවූ දිවයින යන අදහසින් ලාංකාව 'සිංහල දිවයින' යනුවෙන් හැඳින්වෙන්නට ඇත. ඒ සිංහල දිවයිනේ භාවිත වූ භාෂාව සිංහල භාෂාව යනුවෙන් හැඳින්වෙන්නට ඇත.[14]



මේ අදහස් සියල්ල නිශ්චිතාර්ථ හෝ සිද්ධාන්ත නොවේ.

සිංහල භාෂාවේ සම්භවය සෙවීමත් සිංහල ජාතියේ සම්භවය සෙවීම තරම් ම දුෂ්කරය. එය කවදා සිදුවිණිද යන්න නියත වශයෙන් ම පැවසිය නොහැකි වුවත්, සිංහල භාෂාවේ සම්භවය ක්‍රි.පූ. හයවන සියවස තෙක් ඈතට දිවයන බව නූතන වාග්විද්‍යාඥයින්ගේත්, භාෂා විශේෂඥයින්ගේත් පොදු මතයක්ව ඇති බව පෙනේ.[15] මෙම භාෂාවේ ඉතිහාසය ජාතියේ ඉතිහාසය තරම් ම ඈතට දිවයයි. සිංහල භාෂාව අංශ දෙකකින් සමන්විත ය.

1. භාෂණ සිංහලය.
2. ලේඛන සිංහලය.

මෙයින් සිංහල ලේඛනයට පෙර සිංහල භාෂණය ඇරඹෙන්නට ඇත. එහෙත් එය කවදා කෙසේ ඇතිවිණිදැයි නිරනුමානව සඳහන් කළ නොහැකි ය. සිංහලය ශතවර්ෂ ගණනක් තිස්සේ භාෂණයෙහි පමණක් පැවතුණා ද වන්නට බැරි නැත. ලොව ඉපැරණි ශිෂ්ටාචාරවල ද ලේඛනයෙන් තොර භාෂණය පමණක් පැවති භාෂා භාවිත වී ඇති බව පෙනේ.

දකුණු අප්‍රිකාවේ පීරු දේශික ඉන්කා වරුන් වන්වන් අග නගරයත් ඇන්ඩීස් කඳුකරයේ මාචු පිච්චු වැනි අවශේෂ නගරත් කේන්ද්‍රකොට ගෙන ඉන්කා නම් වූ ඔදවත් අධිරාජ්‍යක් ගොඩනඟා ඇත්තේ ලිඛිත භාෂාවක් නොමැතිව ය.[16]

සිංහල භාෂාවේ සම්භවයත් විජය නම් වූ විදේශික ආක්‍රමණිකයාට ම සම්බන්ධ කිරීමෙන් සෑහීමකට පත්නොවී ඉන් ඔබ්බට ද සොයා බැලීම වැදගත් වේ. මන්ද, විජයාවතරණයට ශතවර්ෂ ගණනාවකට පෙරත් ලක්දිව මිනිසුන් වාසය කළ බැවිනි. ප්‍රාග් ඓතිහාසික යුගයේ ලක්දිව විසූ ලාංකිකයන් වංශකථාකරුවන් සඳහන් කරන තරමට ම ම්ලේච්ඡ හෝ නොදියුණු ජන කොට්ඨාසයක් නොවේ. මෙකල ලක්දිව විසූවන් ගෝත්‍රිකයින් හෝ යක්ෂ, නාග, දේව ආදී අමනුෂ්‍ය නාමයන්ගෙන්

යුත් යුගයෝග්‍යතා නොහඳුනන, අස්වාභාවික, අනාර්යයන් සේ දක්වා ඇත්තේ විජය ඇතුළු ආර්යයන්ගේ ආර්ය ලක්ෂණය හුවා දැක්වීමට අවශ්‍ය වූ නිසා වන්නට බැරි නැත.

පෙරදිග රටවල් ගණනාවක ම සිය ආඥා චක්‍රය පැතිරවූ සප්තර්ෂි සමූහයට අයත් පුලස්ති නම් වූ මහර්ෂීන් ද, ඔහුගේ මුණුබුරු රාවණා තාරකාදීන් ද විසූ රට මෙම ලක්දිව ම බව මෙහිදී අමතක නොකළ යුතු ය.[17] ඉන්කාවරුන් මෙන් ඔවුන් ද ලිඛිත භාෂාවක් භාවිත නොකළ ද යම්කිසි භාෂාවකින් කතා කරන්නට ඇත. සකු-මගධ මූලයකට කෙසේවත් සම්බන්ධ නොකළහැකි ඇතැම් සිංහල පියවි පදයක උපත රාවණා වැන්නවුන් රජකළ ප්‍රාග් විජයීය යුගය තෙක් දිවයන්නේ දැයි සොයාබැලුව මනාය. ලිඛිත භාෂාවක් නොතිබෙන්නට ඇතැයි මෙහිදී අනුමාන වශයෙන් සඳහන් කළේ ප්‍රාග් විජයීය යුගයේ නොව ප්‍රාග් මහින්ද යුගයේවත් ලියැවී ඇති ලිපියක් හෝ අක්ෂරයක් තවමත් නිශ්චිතව සොයාගෙන නැති නිසා ය. ඇතැම්විට මුල් යුගවල සිංහලය ද නූතන වැදිබස මෙන් ලංකාවේ කාර්ය භාෂාවක් ලෙස තිබෙන්නට ඇත. මහාචාර්ය නන්දසේන මුදියන්සේ පවසන අන්දමට මෙතෙක් හමුවී ඇති සෙල්ලිපි සියල්ලම පාහේ දෙවනපෑතිස් (ක්‍රි.පූ. 307-267) යුගයෙන් පශ්චාත් යුගවලට අයත් ඒවා ය.[18] එහෙත් ඉන් පෙර යුගවලත් යම් යම් ලේඛන තිබූ බවට වංශකථාවල නම් තොරතුරු සඳහන් වෙයි. වරක් විජය රජුට බිසවක් සොයා දෙන ලෙස කියා ලංකාවෙන් මදුරා පුරයට ලිපියක් යවා ඇත.[19]

රාවණා රජු විසින් කුමාරතන්ත්‍ර හා අර්කප්‍රකාශ යනුවෙන් ග්‍රන්ථ දෙකක් කර ඇතැයි වාල්මීකී සෘෂීන්ගේ රාමායනයේ සහ ජනවහරේ පුරාවෘත්තයක් පැවතුණ ද[20] රාවණා විසින් ම කරන ලද එම ග්‍රන්ථ ඉතිරි කර ගැනීමට තරම් සිංහලයෝ භාග්‍යවන්තයෝ නොවූහ. එබැවින් සිංහල භාෂාවේ සම්භවය සොයා යෑම බෙහෙවින් ම අසීරු කරුණක් වී ඇත.

කාලාන්තරයක් තිස්සේ බොහෝ සාම්ප්‍රදායික භාෂාවේදීන් යත්න දරා ඇත්තේ සිංහලයේ සම්භවය සංස්කෘත හා මාගධී යන මූලභාෂාවලින් සිද්ධ වූ බව ඔප්පු කිරීමට ය. ඒ සඳහා පාදක



වන වදන් සමූහයක් ද ඔවුහු සිය නිබන්ධ තුළට ඇතුළත් කරති. එහෙත් සමස්තයක් වශයෙන් ගෙන සළකා බැලුවහොත් සිංහල භාෂාවේ පාලි, සංස්කෘත පමණක් නොව පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි, දෙමළ මෙන් ම ජපන් වැනි භාෂාවලින් ද පැමිණි තත්සම හා තත්භව වචන රැසක් ම දක්නට ඇත.

ඒ වූ කලී ජීවමාන භාෂාවක ස්වරූපයයි. විවිධ භාෂාවලින් වචන උකහා ගැනීමත්, මිශ්‍රවීමත්, සිය භාෂාවෙන් වෙනත් භාෂාවලට වචන විසිරුවා හැරීමත්, ජීවමාන භාෂාවකින් නිරන්තරව සිදුවේ. එහෙත් ඒ එකක් වත් සිංහල භාෂාවේ සම්භවය සොයා යන්නෙකුට ආලෝකයක් නො සපයයි. එබැවින් වෙනත් භාෂාවක වචනයක් සිංහල භාෂාවේ තිබූ පමණින් සිංහලය එම භාෂාවෙන් හටගත්තායැයි පැවසීම සිංහල භාෂාවට සිදුකරන අගෞරවයකි, අසාධාරණයකි. මේ පිළිබඳ හෙළහවුලේ ඇතැම් උගතුන් දක්වා ඇති මතවාද තරමක් දුරට සහේතුක ය.[21] සිංහල භාෂාව ස්වයංජාත ශුද්ධ වස්තුවක්ය යන අමනෝඥ සිද්ධාන්තය සනාථ කිරීමක් මෙයින් අනපේක්ෂිත ය.

බොහෝ භාෂාවේදීහු සිය භාෂාව ලෝකයේ මූල භාෂාවක් ලෙස හුවා දැක්වීමට යත්න දරනු පෙනේ. සංස්කෘත හා මාගධී යන භාෂා දෙක පිළිබඳව ම මෙබඳු මත-වාද පවතී. එහෙත් මොහෙන්දෝජාරෝ සහ හරප්පා යන නගර නටඹුන් වලින් ප්‍රාග්ඓතිහාසික සංස්කෘතියේ භාෂාව පිළිබඳ පැහැදිලි වීමක් කෙරෙන තුරු, ඉන්දු ආර්ය භාෂාවල ප්‍රමුඛස්ථානය සංස්කෘතයට ලැබෙන බව ඇතමෙකුගේ අදහසයි.[22] මන්ද, දැනට සොයාගෙන ඇති පැරණිම භාෂා ලක්ෂණ දක්නට ඇත්තේ වෛදික සූක්තවල වන බැවිනි. ඒවා ලියැවී ඇත්තේ සංස්කෘත මූල භාෂාවෙනි.

මාගධී භාෂාව පිළිබඳවත් මෙබඳු පුරාවෘත්ත ඇතත් මාගධීයේ ප්‍රභවය සංස්කෘතයේ ප්‍රභවය අභිබවා යන බවක් නොපෙනේ. මාගධී භාෂා හිතෛෂීන් පවසා ඇත්තේ යම් ළදරුවෙක් කිසිදු භාෂාවක් ඇසෙන්නට නොදී හදාගතහොත් වියපත් වූ පසු ඔහු කතාකරන්නේ මාගධී භාෂාවෙන් බව ය. එහෙත් සැබවින් ම කිසිදු භාෂාවක් ඇසීමට නොදී එසේ

ළදරුවෙක් හදාගතහොත් සිදුවන්නේ ඔහු ගොළුවෙකු වීම ය. මන්ද, උච්ඡාරණ ඉන්ද්‍රිය පද්ධතිය ක්‍රියාත්මක වන්නේ ශ්‍රවනේන්ද්‍රිය හා අනුබද්ධව වන බැවිනි.

තවත් ඇතැම් මාගධී භාෂා ප්‍රේමියෙක් දක්වා ඇත්තේ මාගධී භාෂාව බුදුන්වහන්සේ විසින් ඇති කළ ශුද්ධ භාෂාවක් බව ය. එහෙත් බුදුන්වහන්සේගේ ම දේශනාවලට අනුව පෙනෙන්නේ උන්වහන්සේ මගධ දේශයේ තිබූ සමාන භාෂාවන් අතුරින් එක් භාෂාවක් සිය දේශනා සඳහා තෝරාගත් බව ය.[23] කෙසේ වුවත් සංස්කෘත මෙන් ම මාගධී භාෂාවත් පූජනීය වූත් වන්දනීය වූත් භාෂා ලෙස ඉතිහාසගත කරවීමට තත් භාෂා ප්‍රේමීන් වෙහෙසී ඇති ආකාරය යට දක්වන ලද දත්තයන්ගෙන් මොනවට ප්‍රකට වේ.

ඉහත කී ආකාරයට සිංහල භාෂාව ද පූජනීය භාෂාවක් නැතහොත් ශුද්ධ භාෂාවක් කරවීමට ඇතමුන් දරන හරසුන් ප්‍රයත්නය නිසා සිංහල භාෂාවේ ඓතිහාසිකත්වයට පැමිණි ඇති හානිය සුළුපටු නොවේ. සිංහල භාෂාව තනිව පූජනීය තත්ත්වයට පත්කළ නොහැකි අවස්ථාවල එය සංස්කෘත හා මාගධී යන ශුද්ධ භාෂාවලට සම්බන්ධකොට ඒ මගින් උත්තරීතර තත්ත්වයට පත්කිරීම වැයම් කොට ඇති බවක් ද පෙනේ.

සැබවින් ම සිය බසට මෙබඳු පුහු ගෞරවයක් ලබාදීමට උත්සාහ කිරීමෙන් සිදු වී ඇත්තේ සිංහල භාෂාවේ ඓතිහාසිකත්වය විජයාවතරණයෙන් ඔබ්බට යෑම නතරවීමකි. එහෙත් සිංහල භාෂාවේ ඉතිහාසය සංස්කෘත හා මාගධී භාෂාවන්ගෙන් වෙනස් වන හා තත් භාෂාවන් අභිබවා යන අවස්ථා කොතෙකුත් දක්නට ඇත. සංස්කෘත මාගධී යන භාෂා දෙකේම පද වාක්‍යවල යොද අත්තේ ප්‍රකෘතියට විභක්ති ප්‍රත්‍ය ගැන්වීමෙන් බවත් සිංලයේ බොහෝ විට (විශේෂයෙන් පැරණි සිංහලයේ) ප්‍රකෘති පදය එලෙසම තබා විභක්ති අර්ථ සඳහා වෙනමම පදයක් යෙදීම දක්නට ඇති බවත් අලව් ඉසි සැබි හෙල පවසයි[24] එම ලක්ෂණය වඩාත්ම සමීප වනුයේ ආදී පෙරදිග භාෂාවනට හො ඉංග්‍රීසි ආදී යුරෝපීය භාෂාවනට ය. එබැවින් භාෂාවේ ප්‍රායෝගික අංශය නො සළකා, හුදෙක් පද බිඳීම පමණක් සළකා සිංහල භාෂාවේ සම්භවය වෙනත් භාෂාවකට සම්බන්ධ කිරීම කිසිසේත් ම නොකළ මනා ය.



සිංහල භාෂාවේ මුල් ජන්ම භූමිය පිළිබඳ ව ද කාලාන්තරයක් තිස්සේ උගතුන් අතර විවිධ මත - වාද පැවැති බව පෙනේ. සිංහලය නවීන ඉන්දු - ආර්ය භාෂාවන් අතරින් මාගධී භාෂාවට සමීපවන බවත් එම නිසා ම පුරාණ සිංහලය ප්‍රතිවීන ප්‍රාකෘත භාෂාවක් බවත් මහාචාර්ය විල්හෙම් ගෛගර් පවසයි.[25]

ඉහත සඳහන් කළ පරිදි සර් ඩී.බී. ජයතිලකයන් පවසන්නේ සිංහල භාෂාව විජයාවතරණයෙන් පසුව ඇති වූ බවකි.[26] ඔහුගේ මතයට අනුව විජයගේ පැමිණීමෙන් පසුව බොහෝ ආර්යයන් මෙහි පැමිණෙන්නට ඇත. ඔවුන් කතා කරන්නට ඇත්තේ සින්ධු ආර්ය භාෂා ගණයට අයත් එක්තරා ප්‍රාකෘත විශේෂයකිනි. එම නිසා ම මුල් සිංහලය ප්‍රාකෘත ලක්ෂණවලින් ගහණව පැවතිණ.[27]

පොදුවේ සළකාබලන විට සිංහල භාෂාවේ සම්භවය ප්‍රාග් විජයීය යුගය තෙක් දිවයන බව සඳහන් කිරීම යුක්ති යුක්තය. එහි සම්භවය කවදා කෙසේ කොතැනකදී සිදුවිණි ද යන්න නිශ්චිතව ප්‍රකාශ කිරීමට තවත් බොහෝ කලක් ගතවනු ඇත. මන්ද ඉදිරි පුරාවිද්‍යා කැණීම්වලදී හමු වන සාධක අනුව අද භාෂාවේදීන් එළඹෙන නිගමනය හෙට නිශ්ප්‍රභා විය හැකි බැවිනි. එහෙත් එහි සම්භවය කෙසේ සිදු වූවත් එහි වර්ධනයට විවිධ භාෂාවල ආභාසය ලැබී ඇති බව නම් අවිවාදයෙන් පිළිගත යුතුව ඇත.

විශේෂයෙන් ම සිංහලය මනා කොට උගෙණීමට නම් සංස්කෘත, ප්‍රාකෘත, මාගධී, පෛසාචී, අපභ්‍රංශ හා ශෞරශේනි යන භාෂා හය උගත යුතු යැයි කලක් සිංහල වියරණ ඇදුරන් තුළ තිබූ විශ්වාසය ද[28] මෙහිදී සැළකිය යුතුව ඇත. ඔවුන්ගේ මතයට අනුව, යට කී භාෂා හයෙන් අවම වශයෙන් සංස්කෘත, ප්‍රාකෘත හෝ මාගධී වැනි භාෂාවකට සම්බන්ධ කිරීමට තරම් ප්‍රබුද්ධ භාෂාවේදීන් අන්තගාමී නොවිය යුතු ය.

සිංහල භාෂාවේ ඉහත කී ගමන් මග දෙස සාවධානව බලා සිටි ඇතැම් උගත්තු සිංහල භාෂාවේ සංවර්ධනය පිළිබඳ ඉතිහාසය ප්‍රධාන අවධි හතරකට බෙදා දක්වා ඇත.[29]

1. සිංහල ප්‍රාකෘත අවධිය. (ක්‍රි. පූ. 2 සියවස - ක්‍රි.ව. 4 සියවස) දක්වා

2. පුරාතන සිංහල අවධිය. (ක්‍රි.ව. 4 සියවස - ක්‍රි.ව.8 සියවස) දක්වා

3. මධ්‍යතන සිංහල අවධිය, (ක්‍රි.ව.8. සියවස - ක්‍රි.ව. 13 සියවස) 1250

4. නූතන සිංහල අවධිය. (ක්‍රි.ව.13 සියවස - නූතන යුගය) යනුවෙනි.

මෙම සංවර්ධනය මෙසේ කොටස් හතරකට බෙදා දැක්වීමෙන් භාෂාවේ (විශේෂයෙන් අක්ෂරවල) පරිණාමය අධ්‍යයනය කිරීමට මහත් අනුබලයක් ලැබී ඇත. එමෙන් ම සිංහලයේ ව්‍යාකරණ ලක්ෂණ හැදෑරීමටත්, මෙම කොටස් කිරීම උපකාරී වෙයි. ඕනෑම භාෂාවක මුලින් ම ඇතිවන්නේ භාෂණයයි. ලේඛනය ඇති වන්නේ ඉන් අනතුරුවයි. ව්‍යාකරණය බිහිවන්නේ ඊටත් පසුව ය. එහෙත් ව්‍යාකරණයට, නීතියට හෝ සූත්‍රයට නොගැළපුන ද ව්‍යවහාරයේ යම් යෙදුමක් හොඳින් භාවිත වේ නම් එය අශිෂ්ට යෙදුමකැයි කිව හැකි නොවේ. මන්ද, ව්‍යාකරණය ඇති වන්නේ ව්‍යවහාරය අනුසාරයෙන් වන බැවිනි.[30] පාණිනී ආදී සංස්කෘත මහා ශාබ්දිකයින් පවා ව්‍යවහාරයේ පවතින වදන් හා යෙදුම් අශිෂ්ටයැයි බැහැරකොට නැති බව යක්කඩුවේ ප්‍රඥාරාම නාහිමියෝ පවසති.[31]

## සිංහල භාෂාවේ ලේඛන ව්‍යාකරණය.

භාෂාවක පළමුවෙන් ඇති වන්නේ භාෂණය බවත් එම භාෂණයේ ව්‍යවහාරානුසාරයෙන් ව්‍යාකරණය පසුව ඇතිවන බව යට දක්වන ලදී. ඒ අනුව සිංහල භාෂාව ද භාෂණය, හා ලේඛනය හරහා ව්‍යාකරණය තෙක් පැමිණ ඇති බව පෙනේ. සිංහල වර්ණ මාලාව පිළිබඳ සංක්ෂිප්ත විවරණයක් කිරීම වැදගත් ය.

සිංහලයේ භාෂණයට යම්කිසි ව්‍යාකරණයක් ඇතත් ඒ පිළිබඳ බහුතර සිංහලයින්ගේ අවධානය යොමු වී නැති සේ ය. මන්ද, භාෂණයේ ව්‍යාකරණය එම භාෂාව භාවිත කරන විට අනායාසයෙන් ම හුරුවන බැවිනි. එහෙත් එහි යම් කිසි



ව්‍යාකරණයක් ඇති බව පැහැදිලි වන්නේ සිංහල භාෂාව අසිංහලයෙකු කතාකරන විට ය. අසිංහලයන් සිංහල භාෂාව පරිහරණය කරන විට ඇතැම් සිංහලයෙකු සිනහසෙනු දැකිය හැකි ය. ඉන් ගම්‍ය වනුයේ ඔහු භාෂණයේ ව්‍යාකරණය වරද්දා ඇති බවකි. භාෂණයේ ව්‍යාකරණය ඉගෙන ගැණීමට පොත පත විරළ ය. එය උගත යුත්තේ අභ්‍යාසයෙනි. යමෙක් භාෂණයේ ව්‍යාකරණය වරද්දන්නේ නම් එයින් අදහස් කෙරෙන්නේ ඔහුට සිංහල කතා කිරීම පිළිබඳ ආවේණික අභ්‍යාසයක් නැති බව ය. මෙහි දී අදහස් කරන්නේ සිංහලයේ භාෂණ ව්‍යාකරණය නොව ලේඛන ව්‍යාකරණය පිළිබඳ සංක්ෂිප්ත විවරණයක් දැක්වීම ය.

ව්‍යාකරණය යනු භාෂාව පිළිබඳ නිරවද්‍ය ව්‍යවහාරය දක්වන්නා වූ නීති ශාස්ත්‍රය යි.[32] එහි විෂය ක්ෂේත්‍රය ඉතා පුළුල් ය. අධ්‍යයනයේ පහසුව තකා ව්‍යාකරණ ආචාර්යවරුන් විසින් එය විවිධ කොටස්වලට බෙදා දක්වා ඇත.

දැනට ශේෂව පවත්නා සිංහලයේ පැරණි ම ව්‍යාකරණ ග්‍රන්ථය වන සිදත් සඟරාව, සමස්ත සිංහල ව්‍යාකරණය කොටස් (අදියර) විස්සකට බෙදා දක්වා ඇත.[33]

| | |
|---|---|
| 1. සංඥා | 11. ආගම |
| 2. සන්ධි | 12. පූර්වරූප |
| 3. ලිංග | 13. ද්විත්ව රූප |
| 4. විභක්ති | 14. විපර්යාස |
| 5. සමාස | 15. මාත්‍රා වෘද්ධි |
| 6. ප්‍රකෘති | 16. මාත්‍රහානි |
| 7. ප්‍රත්‍ය | 17. නිපාත |
| 8. ක්‍රියා | 18. නියම්විධි |
| 9. ලෝප | 19. අනියම්විධි |
| 10. ආදේශ | 20. අව්‍යුමන් විධි යනුවෙනි. |

මෙම අදියර විස්සෙන් සිංහල වර්ණ මාලාව ඇතුළත් වන්නේ සත් අදියරට ය. මෙය ඉතා සංකීර්ණ බෙදීමකි. එමෙන් ම මෙම බෙදීමේ යම් යම් දුර්වලතා ද තිබේ. සිංහල ව්‍යාකරණය පිළිබඳ මහත් උනන්දුවක් දක්වා ඒ පිළිබඳ විවිධ පර්යේෂණ කළ කුමාරතුංග මුනිදාසයෝ සිංහල ව්‍යාකරණය,

1. අක්ෂර
2. පද
3. වාක්‍ය

යනුවෙන් ප්‍රධාන කොටස් තුනකට බෙදා දක්වති.[34] මීට අමතරව සමස්ත සිංහල ව්‍යාකරණය අධිකාර දහ නවයකින් හෝ විස්තර කර ඇත.[35] මෙම විග්‍රහය ඉතා ඵලදායි එකක් සේ පෙනුණ ද ඔහු එක්තරා ගුරුකුළයකට අයත් වූ බැවින් පොදුවේ මෙම වර්ගීකරණය පිළිබඳ ආධුනිකයාගේ අවධානය යොමු වී ඇති බවක් නොපෙනේ.

සිංහල භාෂාවේ ව්‍යාකරණය පිළිබඳ වාග්විද්‍යාත්මක දෘෂ්ටියක් හෙළමින් තුලනාත්මක විග්‍රහයක් තුළ මහාචාර්ය ජේ බී. දිසානායකයන් විසින් සිංහලයේ ව්‍යාකරණ ක්ෂේත්‍රය අධ්‍යයනයේ පහසුව තකා ප්‍රදේශ හතරකට වෙන් කොට දක්වා ඇත.[36]

එම කොටස් හතර මෙසේ ය.

1. අක්ෂර වින්‍යාසය
2. පද සාධනය
3. වාක්‍ය නිර්මාණය
4. අර්ථ විචාරය. යනුවෙති.

යට දක්වන ලද්දේ සිංහල ව්‍යාකරණය පිළිබඳ කර ඇති බෙදීම් අතුරින් කීපයක් පමණි. මීට අමතරව තවත් බොහෝ උගතුන් සිය පර්යේෂණ කටයුතුවල පහසුව පිණිස විවිධ බෙදීම් ව්‍යාකරණ ක්ෂේත්‍රයේ කර ඇති බව පෙනේ. පොදුවේ සළකා බලනවිට මෙම තේමාව පුළුල් ක්ෂේත්‍රයක් පුරා පැතිර ගොස් ඇති බව පැහැදිලි ය. මේ අතුරින් සිංහල භාෂා ව්‍යාකරණයේ මූලික අංගය වන වර්ණ මාලාව පිළිබඳ අධ්‍යයනයක් කිරීම, මෙම නිබන්ධනයේ අරමුණ වෙයි.



## සිංහල වර්ණමාලාවේ සම්භවය.

සිංහල වර්ණමාලාවේ සම්භවය සොයා යෑමද සිංහල ජාතියේ හා සිංහල භාෂාවේ ඉතිහාසය සොයා යෑම තරම් ම දුෂ්කර කාර්යයකි. සිංහල භාෂාව ප්‍රාග් විජයීය සමජයේ පවා භාෂණයේ පවතින්නට ඇති බව යට සඳහන් කොට ඇත. එහෙත් එකල ලේඛන ක්‍රමයක් තිබූ බවට වංශකථාගත තොරතුරු හැරුණුවිට වෙනත් සාධක ලැබී නැත. එබැවින් සිංහල අක්ෂර මහින්දාගමනයෙන් පසුව විධිමත් ලෙස සකස් වන්නට ඇතැයි සිතීම යුක්ති යුක්ත ය. සිංහල අක්ෂර වර්තමාන ස්වරූපයට අනුව සකස්වන්නට පටන්ගත්තේ ක්‍රි.ව.අටවන සියවසේ පමණ සිටය යනුවෙන් මාහාචායර්‍ය නන්දසේන මුදියන්සේ ඉදිරිපත් කර ඇති මතය මෙහිලා විමසුව මනාය.[37] එයින් අදහස් කෙරෙන්නේ ඊට පෙර අක්ෂර නොතිබුණ බව නොවේ. එහෙත් ඒ පුරාණ අක්ෂර හැඳින්වූයේ සිංහල අක්ෂර යනුවෙන් නොවේ.

ප්‍රාග් මහින්ද යුගයේත්, තදාශ්‍රිත යුගවලත් සෙල්ලිපි, ලෙන්ලිපි හා පුවරු ලිපි ලියැවී ඇති අක්ෂර "**බ්‍රාහ්මී**" යනුවෙන් හැඳින්වෙන අතර, අයෙක් ඒවා අශෝකාක්ෂර යනුවෙන් ද හඳුන්වති. එයට හේතුව භාරතයේ අශෝක අධිරාජයා පිහිටුවා ඇති සෙල්ලිපිවල ඇති අක්‍ෂර ද බ්‍රාහ්මී අක්‍ෂරවලට සමාන හෙයිනි. එහෙත් බ්‍රාහ්මී යනු අක්‍ෂර විශේෂයක් මිස භාෂාවක් නොවන බව[38] මෙහිදී සිහි කටයුතුය. එම නිසා ඒ ඒ භාෂාවල භාවිත කළ බ්‍රාහ්මී අක්‍ෂරවලින් ලේඛනගත කිරීම මෙකළ අභිමතව පැවති බව පෙනේ. මෙය ක්‍රිස්තු පූර්ව යුගවල සිදුවූ දෙයකි. භාරතයේ ද ඇතැම් පාලි සංස්කෘත හා ප්‍රාකෘත වැනි භාෂාවල ලිපි බ්‍රාහ්මී අක්ෂරවලින් ලියා ඇත. එම නිසා ක්‍රිස්තු පූර්ව යුගවල විසූ ලාංකීය සිංහල බෞද්ධයින්ද සිංහල බසින් කිවයුතු අදහස මහින්දගමනයෙන් පසු මෙහි පැමිණි උගතුන්ගෙන් බ්‍රාහ්මී අක්‍ෂර උගෙන සිංහල බස බ්‍රාහ්මී අක්‍ෂරයෙන් ලියන්නට ඇත. ලේඛනගත කිරීම මෙකල අභිමතව පැවති බව පෙනේ. මෙම අක්ෂර සෙල්ලිපිවල මෙන් ම රන්පත් හා, තඹපත් ආදියේත්, සීගිරි කැටපත් පවුරේත් දක්නට ඇත. ලෝකයේ බොහෝ ප්‍රාථමික භාෂා එසේ ලේඛන වර්ණ නොමැතිව බිහි වී ඇත. මාගධී භාෂාව ද ඒ අතර වෙයි.



UNIVERSITY 2000

යට දක්වන ලද හේතු සාධක අනුව සිංහල වර්ණමාලාව බ්‍රාහ්මී අක්ෂර (අශෝකාක්ෂර) පරිණාමයට පත්වීමෙන් සකස් වී ඇති බව පෙනේ. මෙම පරිණාමය අක්ෂර අධ්‍යයනය කිරීමේදී භාෂා යුග පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් ය. භාෂා යුග බෙදී ඇති ආකාරය ද විවිධ ය. කෙසේ හෝ බෙදා වෙන්කර ඇති යුගවලදී සිංහල වර්ණමාලාව පරිණාමයට පත් වී ඇති ආකාරය රූප සටහන් මගින් නිදර්ශන ඉදිරිපත් කරමින් ග්‍රන්ථ කීපයක ම[39] දක්වා ඇති හෙයින් ඒ ඒ පිළිබඳ සවිස්තර සටහනක් මෙහි නොදැක්වේ.

මෙහිදී විශේෂයෙන් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන්නේ සිංහල වර්ණමාලාවේ නූතන හැඩගැසීම් කීපයක් පිළිබඳව ය. නූතන සිංහලයේ ම වර්ණමාලා කීපයක් දක්නට ඇත. ඒවා ය, නිරන්තරව වෙනස් වීම් වලට භාජනය වන්නේ. සෙල්ලිපි වර්ණමාලාව පරිණාමය වීමෙන් නූතන වර්ණමාලාව සකස් වී ඇද්දැයි පැවසිය නොහැකි තරමට නූතන වර්ණමාලාව වෙනස් වී ඇත. නූතන වර්ණමාලාවේ වුව අක්ෂරවල හැඩය වෙනස්වීම මේ වන විට බොහෝ දුරට නතර වී ඇත. එයට හේතුව මුද්‍රණ ශිල්පය මෙරට පැමිණීමත් සමග අක්ෂරවලට ස්ථාවර ස්වරූපයක් ලැබීම ය. එබැවින් නූතන සිංහල වර්ණමාලාව පරිණාමයට පත්වන්නේ අක්ෂරවල ස්වරූපය වශයෙන් නොව පරිපූර්ණ අක්ෂර වශයෙනි.

බ්‍රාහ්මී අක්ෂර පරිණාමයට පත්වීමෙන් පසු බිහි වූ වර්ණමාලාවන් කීපයක් ම නූතන සිංහලයේ දක්නට ඇත. සිංහල සෙල්ලිපිවල එන අක්ෂර සංග්‍රහකොට දක්වා ඇති පුරාක්ෂර වර්ණමාලාව ඉන් එකකි. සිංහලයේ පද්‍ය හෝඩිය ලෙස දැක්වෙන සිදත් සහරාවර්ණමාලාව තව එකකි. එය ශුද්ධ සිංහල වර්ණමාලාව ලෙස ද සැළකේ. සංස්කෘත හා පාලි යන භාෂා ඇසුරෙන් සකස් කරගත් මිශ්‍ර සිංහල වර්ණමාලාවක් ද සිංහලයට ඇත. එයට බෙහෙවින් සමාන පද්‍යයෙන් ම කළ වර්ණමාලාවක් වදන්කවි පොතේ එයි. මීට අමතරව භාෂාණ සිංහලය සඳහා ද ලේඛනගත නොවූ වර්ණමාලාවක් ඇත. සෙල්ලිපිවල ඇති බ්‍රාහ්මී අක්ෂරමාලාවේ විකාශනය හා පරිණාමය පිළිබඳ මනා පැහැදිලි කිරීම් ගණනාවක් අක්ෂර විද්‍යාඥයින් විසින් මේ වන



විට ප්‍රකාශයට පත්කොට ඇති බැවින් එම විකාශන සටහන් මෙහි උපුටා දැක්වීමට අදහස් නොකෙරේ. එබඳු පැහැදිලි කිරීම් කොතෙක් කර තිබුණද සිංහල භාෂාව හදාරන ආධුනිකයින් බොහෝ දෙනෙකුට මේ පිළිබඳ ඇති දැනුම ඉතාමත් අල්ප බව මහාචාර්ය බන්දුසේන ගුණසේකරයන් විසින් පෙන්වා දෙනු ලැබ ඇත.

දැනට සිංහලයේ පවත්නා විවිධ වර්ණමාලාවන් සංග්‍රහ කොට දක්වා ඒවා අනුසාරයෙන් අද්‍යතන භාෂණ සිංහලයට ද උචිත වන අයුරින් නව වර්ණමාලාවක් සකස් කර ගැනීමේ අවශ්‍යතාව පෙන්වා දීම මෙම නිබන්ධයේ මීළඟ අරමුණ ය.

**අමිශ්‍ර සිංහල වර්ණමාලාව (සිදත් සහරා හෝඩිය)**

ස්වර:10 අ ආ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ

ව්‍යංජන:20 ක ග ජ ට ඩ ණ ත ද න ප බ ම

ය ර ල ව ස හ ළ අං

මෙම වර්ණමාලාවේ දක්නට ඇති ප්‍රධානතම දුර්වල කමක් වන්නේ සිංහලයේ නිරන්තරව භාවිත වී ඇති ඇ, ඈ යන වර්ණ දෙක වර්ණමාලාවට ඇතුළත්කර නොතිබීමයි. සිදත් සහරා කතුවරයා පවසන්නේ එම අක්ෂ දෙක **මාත්‍රාවෘද්ධි** කියා ය.[40] එහෙත් සිංහලයේ **ඇකාරය** මාත්‍රාවෘද්ධියක් ලෙස සැළකීමට අපහසු ය. සිංහලයේ **ඇකාරය** වූ කලී එසේ ඉවතට දැමිය හැකි අක්ෂරයක් නොවේ. මෙය සිංහල භාෂාවේ ලක්ෂණයක් බවත් මෙම ඇකාරය නිපන්නේ පැරණි **එකාරය** ද ශබ්ද මධ්‍යගත **අකාරය** ද **ඉකාරය** ද එක්වීමෙන් බවත්, මෙය ක්‍රි.ව. අටවන සියවසේදී භාවිතයට පැමිණෙන්නට ඇති බවත්, වැලිවිටියේ සෝරත නාහිමියෝ පෙන්වා දෙති.[41] සිදත් සහරා වර්ණමාලාව සිංහලයට ප්‍රමාණවත් නොවන්නකැයි කියමින් එය දෝෂ දර්ශනයට ලක් කිරීම සාධාරණ නොවේ. මන්ද, එය ලියැවී ඇත්තේ සිංහල පද්‍ය සාහිත්‍ය සඳහා වන බැවිනි.

**මිශ්‍ර සිංහල වර්ණමාලාව.**

**ස්වර.** අ ආ ඇ ඈ ඉ ඊ උ ඌ එ ඒ ඓ

ඔ ඕ ඖ ඍ ඎ ඏ ඐ අං අඃ

**ව්‍යංජන.** ක ඛ ග ඝ ඞ

ච ඡ ජ ඣ ඤ

ට ඨ ඩ ඪ ණ

ත ථ ද ධ න

ප ඵ බ භ ම

ය ර ල ව

ශ ෂ ස හ ළ

මෙය සංස්කෘත හා මාගධී යන භාෂා ඇසුරින් සම්පාදනය වූ එකක් බව පෙනේ. සිංහලයේ බොහෝ විට පරිහරණය වන්නේ මෙම වර්ණමාලාවයි. මෙය වෙනත් භාෂාවන් ඇසුරින් සම්පාදනය වුවත් මෙහි සිංහලයට ආවේණික ලක්ෂණ දක්නට ඇත. මෙහි දැක්වෙන **ඇ** සහ **ඈ** යන රූප දෙක එබඳු ආවේණික ලක්ෂණයකි. මෙම **ඇකාරය** අටවැනි සියවසට ආසන්නයේ දී පමණ සිංහල භාෂාවට එක් වී ඇතැයි හා, පාලි, සංස්කෘත, හින්දි, දෙමළ, හා ප්‍රාකෘත වැනි භාෂාවල ඇකාර භාවිතයක් දක්නට නැත. එම ඇකාර ලක්ෂණය හැරුණු විට සෙසු වර්ණමාලාව පුරා ම දක්නට ඇත්තේ අනුකාරක ස්වභාවයකි. සිංහලයට අවශ්‍ය නොවන අකුරු කීපයක් ම මෙයට ඇතුළුකර ඇත. එබඳු බලහත්කාරකමක් සිංහල වර්ණමාලාවට සිදුකරන ලද්දේ කාගේ වුවමනාවකටදැයි නොදැනේ. "**ඏ**" සහ "**ඐ**" යන අක්ෂර දෙක සිංහලයේ යෙදී නැතැයි ප්‍රකාශ කිරීමට අකමැති භාෂා ප්‍රේමීන්ට ඒ සඳහා දැක්විය හැකි නිදර්ශනය වදන් කවි පොතේ එන "**ඏකුල**" යන වචනයයි. කෙසේ වෙතත් සිංහල යතුරු ලියනයට



හා සිංහල මුද්‍රණ අක්ෂර අතරට මෙම **ඏ** අක්ෂරයේ දහර ගැසූ වර්ණ ඇතුලත් වී තිබුණේ නම් ඏ අක්ෂර ප්‍රේමීන්ට මේ ගැන තවදුරටත් මොන මොනවා හෝ ලියන්නට, පළකරන්නට අවස්ථාව ලැබෙනු ඇත.

**වදන් කවි පොතේ දක්වා ඇති වර්ණමාලාව**

ස්වර, අ ආ ඉ ඊ උ ඌ ඍ ඎ ඏ ඐ

එ ඒ ඓ ඔ ඕ ඖ අං අඃ

ව්‍යංජන, ක ඛ ග ඝ ඞ

ච ඡ ජ ඣ ඤ

ට ඨ ඩ ඪ ණ

ත ථ ද ධ න

ප ඵ බ භ ම

ය ර ල ව

ශ ෂ ස හ ළ

වදන් කවි පොතේ දැක්වෙන මෙම වර්ණමාලාව ද සිංහලයට ආවේණික වූ වර්ණමාලාවක් නොවේ. මෙයද සංස්කෘත සාරස්වත ව්‍යාකරණයට අනුව සකස් කරන ලද්දකි. එහෙත් මෙම ග්‍රන්ථයේ වර්ණමාලාව කවියට නහා ඇති ආකාරය ඉතාමත් සිත් ගන්නා සුළු ය.[42] එමෙන්ම අක්ෂර උත්පත්තිස්ථාන, හා කරණ, ආදී වශයෙන් කවියෙන් ම කර ඇති ශබ්ද විද්‍යාත්මක පැහැදිලි කිරීම ඉතාමත් වැදගත් ය. වදන් කවි පොතේ "අං" යන අක්ෂරය ස්වර කොටසටත් ව්‍යංජන කොටසටත් ඇතුලත් කර ඇති බව පෙනේ. එහෙත් එය ව්‍යංජන කොටසට ඇතුල් කොට ඇත්තේ කවියේ පදපූර්ණය පිණිස යැයි සිතේ. මන්ද, පසු කවියක ව්‍යංජන තිස්හතරක් බව දක්වා ඇති හෙයිනි.[43] වදන් කවි පොත රචනා වී ඇත්තේ මහනුවර රාජධානි සමයේ ය. එම යුගය

සාහිත්‍ය ඉතිහාසයේ සඳහන්ව ඇත්තේ අඳුරු යුගයක් ලෙස ය. එබඳු යුගයක පවා සිංහල අක්ෂර මාලාව රැකගැනීමට දරා ඇති ප්‍රසංශනීය ප්‍රයත්නයක් ලෙස වදන් කවි පොත අගය කළ හැකි ය. මහනුවර යුගය වන විට සිංහල අක්ෂර මාලාවේ පරිණාමය පිළිබඳව ද එයින් දත හැකි ය.

මීළඟට සළකා බැලිය යුතුව ඇත්තේ යට දක්වන ලද වර්ණමාලාවන් නූතන සිංහල භාෂා භාවිතයට ප්‍රමාණවත් වන්නේ ද යන බව ය. මෙම නිබන්ධය ආරම්භයේ දැක් වූ පරිදි ජීවමාන භාෂාවක් වූ සිංහලය දිනෙන් දින ආගන්තුක වචන උකහාගනිමින් ගලායන්නක් වන බැවිනි, එම ගැටළුව ඇතිවනුයේ. එසේ එක් වන ඇතැම් අළුත් වචනයක් ලිවීම සඳහා මෙම සාම්ප්‍රදායික වර්ණමාලාව ප්‍රමාණවත් නොවෙයි. එසේ එක් වන තත්සම වචන වෙනුවට සිංහල තත්භව වචන සකස් කරගත නොහැක්කේ මන්දැයි ඇතමෙක් ප්‍රශ්න කරන බව ද මෙහිදී අමතක නොකළ යුතු ය. සැබවින් ම සෑම ආගන්තුක වචනයකට ම සිංහල තත්භව වචන සකස් කිරීමට අපහසු ය. එහෙත් මෙහිදී මතුවන ලොකුම ගැටළුව එය නොවේ. එකසේ අපහසුවෙන් හදාගන්නා තත්භව වචනය හැරපියා, පොදු ජනතාව සුපුරුදු තත්සම වචනය ම භාවිත කිරීම ය.

වෙනත් භාෂාවලින් පැමිණි ආගන්තුක වචන වෙනුවට සකස් කරගත් තත්භව වචන හුදෙක් උගතුන්ගේ ලේඛනයේ හා ව්‍යවහාරයේ පවතිද්දී බහුතර ජනතාව එම ආගන්තුක වචනය ම පරිහරණය කරනු දැකීම වර්තමාන සිංහලයේ සාමාන්‍ය දෙයක් බවට පත්ව ඇත. එයින් සිදු වන්නේ භාෂා ද්විරූපතාව ය. වර්ධනය වීමකි. එම නිසා වෙනත් භාෂාවලින් පැමිණ ඇති වචන තත්සම වචන ලෙස ම භාෂාවේ පරිහරණය වීමට ඉඩ දීමෙන් සිය බසට සිදුවන හානිය එම වචනවලට අළුතින් තත්භව වචන සෑදීමෙන් සිදුවන හානිය තරම් බලවත් නොවේ. සිංහල වර්ණමාලාවේ පරිණාමයට මෙම භාෂාවේ වචන වෙනස් වීම බෙහෙවින් ම බලපා ඇති බව පෙනේ.



හැකියාවක් තිබේ නම් ඕනෑම විදේශ වචනයකට සිංහල වචන සකස් කළාට වරදක් නැත. එහෙත් එසේ සකස් කරගන්නා වචනය උච්ඡාරණයට හෝ ස්මරණයට අපහසු වේ නම් එවන් වචන පොදු ජනතාවගේ ව්‍යවහාරයෙන් ඈත්වන බව නම් අවබෝධ කරගත යුතු ය. අවශ්‍ය පඬිවරුනට එවන් ගම්භීර, පවිත්‍ර, ශුද්ධ සිංහල වචන සිය භාවිතයට යොදා ගත හැකි ය. සිංහල භාෂාව වර්ධනය වෙමින් පැවති මුල් අවධියේ සිට ම එසේ භාෂාව පරිහරණය කරන්නන් අතර උස් පහත් භේදයක් තිබූ බව පෙනේ. අනුරාධපුර යුගයේ දී ද සංස්කෘත හා මාගධී වැනි භාෂා හොඳින් දත් මහ පඬිවරුන් මෙන් ම හුදෙක් **"සියබස"** පමණක් දත් පොදු ජනතාව ද සිටි බව සියබස්ලකර කතුවරාගේ අරමුණ පැහැදිලි කිරීමේ ගීයෙන් මනාව පැහැදිලි වෙයි.[44]

සිංහල භාෂාවේ භාෂණය හා ලේඛනය යනුවෙන් ප්‍රධාන කොටස් දෙකක් ඇති බව යට දක්වන ලදී. එයින් ලේඛනය මෙන් ම භාෂණය ද සිංහල භාෂාවේ ම කොටසක් වන බැවින් එයට ද වර්ණමාලාවක් තිබිය යුතු ය. මන්ද භාෂණය ඒ අයුරින් ම ලේඛනගත කිරීමට අවශ්‍ය වූ විට ඒ සඳහා වර්ණමාලාවක් වුවමනා වන බැවිනි. පොලීසියකට ගොස් පැමිණිල්ලක් ඉදිරිපත් කරන පැමිණිලිකරුගේ ප්‍රකාශය එහි සටහන් කරගනුලබන්නේ ඔහුගේ භාෂණය ඒ අයුරින් ම මිස එය ලිඛිත භාෂාවට පෙරලීමෙන් නොවේ. එම නිසා එහිදී පැමිණිලිකරු ඉදිරිපත් කරන සෑම වචනයක් ම කිසිදු වෙනසක් නොකර ඒ අයුරින් ම සටහන් කරගැණීමට තරම් පොහොසත් වර්ණමාලාවක් සිංහලයට ඇත්තේ නම් මැනවි. නවකතා කෙටිකතා හා විශේෂයෙන් ම චිත්‍රපට තිර රචනා මෙන් ම නාට්‍ය පිටපත් ආදියට ද භාෂණ සිංහලය අත්‍යවශ්‍ය ය. දැනට ලේඛන සිංහල වර්ණමාලාව ම පිරිමසා ගනිමින් එවැනි කටයුතු ඉටුකළ ද ඉදිරියේ දී භාෂණ වර්ණමාලාවක් සිංහල භාෂාවට නැතිකමේ අඩුව වඩාත් තදින් දැනෙනු ඇත. නූතන භාෂා විශේෂඥයින්ගේත්, වාග්විද්‍යාඥයින්ගේත් අවධානය මේ සඳහා දැනටමත් යොමු වී ඇති අතර විවිධ යෝජනා ද ඉදිරිපත් වී ඇත.

නූතන සිංහල භාෂාවේ පවත්නා භාෂණය ලේඛනගතකිරීම සඳහා උපයෝගිකරගත හැකි සරල වර්ණ මාලාවක් මෙසේ ඉදිරිපත් කළ හැකි ය.

**භාෂණ සිංහල වර්ණ මාලාව:-**

ස්වර,

පූර්ව ස්වර:- ඉ, ඊ, එ, ඒ, ඇ, ඈ

මධ්‍ය ස්වර:- අ, ආ

අපර ස්වර:- උ, ඌ, ඔ, ඕ, අ, ආ

ව්‍යංජන:-

ස්පර්ශ:- ප බ ත ද ට ඩ ච ජ ක ග

නාසික:- ම න (ණ) ඤ ඞ

ඌෂ්ම:- ශ ෂ ස ෆ ද්ස හ

පර්ශ්වීය:- ල

රේඵ:- ර්

අර්ධ ස්වර:- ය ව

අර්ධානුනාසික:- ඹ ඳ ඬ 'ජ හ හ 'අ

මෙය ද නිශ්චිත වර්ණමාලාවක් නොවේ. ඉදිරියේ දී සිංහලයට එක්වන අලුත් වචන ලේඛනගත කිරීමට මෙම වර්ණමාලාව ප්‍රමාණවත් වන්නේදැයි සළකා බැලීමත් ප්‍රමාණවත් නොවන්නේ නම් අවශ්‍ය වර්ණ එක්කර ගැනීමත්, අනවශ්‍ය වර්ණ කපාහැරීමත්. භාෂා විශේෂඥයින්ගේ වගකීමකි. එසේ නොමැතිව එකිනෙකාගේ රුචි අරුචිකම් මත ජාතික භාෂාවක වර්ණමාලාව වෙනස් කිරීම නොකළ යුතු ය.



යට දැක්වූ කරුණු දෙස උපේක්ෂිතව බලා සිටින විට පෙනී යන්නේ සිංහල වර්ණමාලාව යුගයෙන් යුගයට වෙනස් වී ඇති බව ය. එම නම්‍යශීලී වෙනස් වීම නිසාම ය, සිංහලය තවමත් ජීවමාන භාෂාවක්ව පවතින්නේ. කාලයට හා පරිසරයට අනුව හැඩගැසීමේ හැකියාව ඇති සිංහල නම් වූ ජීවමාන භාෂාව අදත් හෙටත් එසේ වෙනස් වෙමින් ඉදිරියට ගලායනු ඇත. එම වෙනස්වීම එම භාෂාව කතා කරන්නන්ගේත්, එම භාෂාවට ආදරය කරන්නන්ගේත්, ප්‍රසාදයට හෝ සංවේගයට හේතුවක් නො වනු ඇත.

**පාදිත ග්‍රන්ථ**


1. අනුරාධපුර යුගය, 50-54 පිටු.
2. ව්‍යාකරණ විවරණය, කුමාරතුංග මුනිදාස, දෙවන සැකැස්මේ පස්වන පැහැරවුම, 1983 - පිට -
3. සිංහල භාෂාව, තියොඩෝර් ජී පෙරේරා උන්නාන්සේ - 1932 - ප්‍රථම පරිච්ඡේදය - පිට 01
4. එම පිට 02
5. ඌණ පූර්ණ සහිතො මහාවංසො 6,7, පරිච්ඡේද - පොල්වත්තේ බුද්ධදත්ත මහාථෙර, 38-50
6. සිංහල ශබ්දකෝෂය - ප්‍රථම භාගය, සර් ඩී.බී. ජයතිලක -1937 - සිංහල භාෂාව - පිට XII
7. ඌණපූර්ණ සහිතො මහාවංසො - 74 පිට - 14 පරිච්ඡේදය - 63 ගාථාව.

   සථෙරො තත්ථ ගන්ත්වාන - මහා ථෙරෝ නිසීදිය

   සෝ දේව දූත සුත්තංතං - කථෙසි කථිකෝ මහා
8. පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය- හේම එල්ලාවල - 1968 - පිට3.
9. එම පිට 03.
10. සිංහල සාහිත්‍ය වංශය - පුංචි බණ්ඩාර සන්නස්ගල - දෙවන සංස්කරණය - 1964 - පිට 07.

11. මහා වංශය - 7 පරිච්ඡේදය - 42 ගාථාව.

සීහබාහු නරින්දෝ සෝ - සීහමාදින්නවා ඉති
සීහළෝ තෙන සම්බන්දෝ - ඒතේ සබ්බේපි සීහළා.

12. ධම්පියා අටුවා ගැටපදය - මැදඋයන්ගොඩ විමලකිත්ති හිමි- 1960- පිට 05.

13. භාෂා විඥාන - භාෂා විෂයක ලිපි සංග්‍රහය - 1989 - සිංහල - ඒ. ඒ. අභයසිංහ - පිට 20.

14. එම පිට

15. නූතන සිංහල ලේඛන ව්‍යාකරණය - මහාචාර්ය ජේ.බී. දිසානායක - 1990 - සංඥාපනය- පිට 01.

16. සිව්දෙස - 1992 දෙසැම්බර් - 14 පිට.

17. එළිදරව්ව - IV - ඩබ්.ඒ. සිල්වා.

18. සිංහල අකුරුවල ඉතිහාසය - නන්දසේන මුදියන්සේ - පිට 01.

19. මහාවංශය - 7 පරිච්ඡේදය - 49 ගාථාව.

පණ්ණාකාරේ මහාසාරේ - මණිමුත්තාදිකේ බහු
ගහාපයිත්වා පාහේසුං - දක්ඛිණං මධුරං පුරං

20. මාතලේ ලග්ගල ප්‍රදේශයේ කළ ජනශ්‍රැති අධ්‍යයනයකදී බොහෝ ගැමියන් විසින් රාවණ පිළිබඳ මෙබඳු විස්තර රැසක් ම ඉදිරිපත් කෙරිණ.

21. ශාස්ත්‍රීය නිබන්ධන - අලව් ඉසි සැබිහෙළ - 1973 - සිංහල වාග් විද්‍යාව පිට 02.

22. සිංහලයේ පරිණාමය - තෙරිපැහැ සෝමානන්ද හිමි - 1961 - ප්‍රස්තාවනාව - මොරටුවේ සාසනරතන හිමි, XIV

23. අර්ණවිභංග සූත්‍රය - මජ්ඣිම නිකාය.

24. සියබස්ලකර විවරුව - අලව් ඉසි සැබිහෙළ 1963 - පෙරවදන - පිට XXXIX

25. ශ්‍රී සුමංගල ශබ්දකෝෂය - ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය - ද්විතීය භාගය - පණ්ඩිත වැලිවිටියේ සෝරත - 1956 - පිට 1165

26. සිංහල ශබ්ද කෝෂය - ප්‍රථම භාගය - සර්. ඩී. බී. ජයතිල-1937 - සිංහල භාෂාව.



27. කියවන්න එම පිටු XIII, X/LII, X/IV

මුල්ම සිංහලයේ පැවති ප්‍රාකෘත භාෂා ලක්ෂණ කීපයකට මෙහි නිදසුන් දක්වා ඇත. ජාත්‍රයනගේ පහසුව තකා එම නිදසුන් කීපයක් පහත උපුටා දැක්වේ.

1. ස්වර මධ්‍යගත කේවල කණ්ඨජ හා දන්තජයන් අලුප්තව සිටී. ආගත > අගත.

11 මහප්‍රාණාක්ෂර අල්ප ප්‍රාණ වී ඇත.

ථෙර > තෙර, හරියා > බරිය (වෙස්සගිරිය ලිපිය)

111 කේවල සකාරය හකාරය වී ඇත.

සාටිකා > හාටික, පොසථ > පොහත (වෙස්සගිරිය ලිපිය)

IV දීර්ඝ ස්වර හ්‍රස්ව

වී ඇත.

වාපිවපි

V ව්‍යංජනයකට පෙර සිටි අනුනාසිකය (වර්ගාන්තය) හා අනුස්වාරය රූපයෙන් නොදැක්විණ (උච්ඡාරණයේ තිබෙන්නට ඇත)

සන්තක > සතක දෙවානංපිය > දෙවනපිය.

VI සංයුක්තාක්ෂර කේවලාක්ෂර බවට පත්ව ඇත.

පුත්ත > පුත, ගුත්ත > ගුත, හත්ත > බත

VII සංස්කෘත ස.ශ, ෂ යන ඌෂ්ම අක්ෂර තුන වෙනුවට ස, ශ යන උභයාක්ෂර පමණක් යෙදීම ආදී වශයෙනි.

28. ප්‍රාකෘත ප්‍රකාශ - කේ. ඇම්. ඩබ්. කුරුප්පු - 1969 - ප්‍රාකෘත ප්‍රකාශ හැදෑරීමේ ප්‍රයෝජන - පිට VII

29. සිංහල ශබ්දකෝෂය ප්‍රථම භාගය - සර් ඩී.බී. ජයතිලක - 1937 - පිටු X/1, X/II

30. සිදත් සහරාව - කුමාරතුංග මුනිදාස - 1965 - 43 පිට;

සද්රුත් විදි සියල් - අනුරූ සේ පියෝතන්
ඉති සත් සඳ විබත් ඈ - **වහරනුසෙරත් සපයා.**

31. 'විදුලකර' විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ වාර්ෂික ප්‍රකාශනය - 1961 - පළමුවන අංකය ව්‍යවහාර සිංහලය අශිෂ්ට ද? - යක්කඩුවේ ප්‍රඥාරාම නාහිමි.

32. ව්‍යාකරණ විවරණය - කුමාරතුංග මුනිදාස - 1983 - පිට 01.

33. සිදත් සහරාව - කුමාරතුංග මුනිදාස - 1965 - පිට 1, සිදත් සහරා

පෙළ - කියවන්න,

එබැවින් සත් සඳ ලිහු විබත් සමස් පියෙවි

පස කිරිය ලොප දෙස ගම් පෙර රු දෙරු පෙරලී

වැඩි අඩු නිපා නියම් අනියම් අවිදුමන් විදි

වී විසි වැදෑරුම් මෙහි වියරණ විදින් සපයා

34. ව්‍යාකරණ විවරණය - කුමාරතුංග මුනිදාස - 1983 - පිට 03

35. කියවන්න, එම පටුන

මෙහි දක්වා ඇති ආකාරයට අනුව ව්‍යාකරණ විවරණය කොටස් (අධිකාර) දහනවයකින් සමන්විත ය. අධ්‍යයනයේ නිරත වන්නන්ගෙ පහසුව තකා එය සැකෙවින් පහත දක්වා ඇත. 1ව්‍යාකරණය, 2. අක්ෂරය, 3 ශබ්ද සංවිධාන, 4 පද, 5 මූල ප්‍රකෘතිය, 6 නාම ප්‍රකෘතිය, 7 නාම යෝග්‍යකරණය, 8 නාම පද සම්බන්ධය, 9 ආඛ්‍යාත ප්‍රකෘතිය, 10 ආඛ්‍යාත සාධනය 11 ආඛ්‍යාත සම්බන්ධය, 12 නිපාත, 13 සංග්‍රහ නාම ප්‍රකෘතිය 14 සංග්‍රහ ආඛ්‍යාත ප්‍රකෘතිය 15 සංග්‍රහ නිපාත ප්‍රකෘතිය, 16 වාක්‍ය 17 වාක්‍ය මිශ්‍රණය, 18 වාක්‍ය සංග්‍රහ, 19 විභාගය

36. නූතන සිංහල ලේඛන ව්‍යාකරණය - 1 - අක්ෂර වින්‍යාසය - ජේ.බී. දිසානායක - 1990 - පිට - 8,9 - ව්‍යාකරණ ක්ෂේත්‍රය.

37. සිංහල අකුරුවල ඉතිහාසය - මහාචාර්ය නන්දසේන මුදියන්සේ - පිට 01.

38 සිංහල ශිලා ලේඛන - ඩබ්. ඇස්. කරුණාරත්න - 1960 - පිට 3

39. සිංහල අක්ෂර පරිණාමය ගැන සඳහන් ව ඇති පොත්පත්වලින් කීපයක්,

සිංහල ශිලා ලේඛන - ඩබ්. ඇස්. කරුණාරත්න

සිංහල ශබ්ද කෝෂය - සිංහල භාෂාව

සිංහල අකුරුවල ඉතිහාසය - මහාචාර්ය නන්දසේන මුදියන්සේ.

සිංහල භාෂාව - තියොඩෝර් ජී. පෙරේරා උන්නාන්සේ

සිංහල අකුරු ශබ්ද ශික්ෂණය - මහාචාර්ය බන්ධුසේන ගුණසේකර

සිංහලයේ පරිණාමය - තෙරිපැහැ සෝමානන්ද හිමි.

ප්‍රාකෘත ප්‍රකාශ - කේ. ඇම්. ඩබ්. කුරුප්පු

40. සිදත් සඟරාව - අමරසිරි ගුණවඩු සංස්කරණය - 1965 - පිට 04 - 'වැඩිනම් මත්වැඩි, ඇස් - ඇල් - ඇප් - උවාරණ ඇ ගී'



41. ශ්‍රී සුමංගල ශබ්දකෝෂය - ද්විතීය භාගය - පණ්ඩිත වැලිවිටියේ සෝරත - 1956 - පිට 09.

42. වදන් කවි පොත - තුන්වන මුද්‍රණය - 1986 - මෙහි හෝඩියේ අක්ෂර සියල්ල කවියට නගා ඇත.

ස්වස්ති විභූෂණ කමලා වදනින්
සිද්ධමලංකෘත විමලා වදනින්
අ තුලිත මුනිවර චරණා වදනින්
ආ භා භාසුරා කිරණා වදනින්

ඉ හ කුල පූජිත චරණා වදනින්
ඊ ෂ නිශාකර හරණා වදනින්
උ මා වධූපති මහිමා වදනින්
ඌ රු මනෝහර ජංගා වදනින්
ඍ ණජ නයනා මෘතයා වදනින්
ඎ කල්පායන කිරණා වදනින්
ඏ කුල සන්තති භුවනා වදනින්
ඐ පති මිහිමපති මහිමා වදනින්. ආදී වශයෙනි.

43. එම 13 පද්‍යය

44. සියබස්ලකර - අලව්ඉසි සැබිහෙළ - ප්‍රථම මුද්‍රණය - පළමුවන සග - ඇරැඹුම - 3 ගීය.



VERSITY
LIBRARY